**10 ශ්‍රේණිය.**
**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**දෙවෙනි වාරය - අටවෙනි සතිය.**

<u>ක්‍රියාකාරකම.</u>

- බැද්දේගම නවකතාව
  - බැද්දේගම නවකතාවෙහි පසුබිම මැනවින් හඳුනාගන්න.
  ඒ සඳහා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. (අ) සිංහල ජන ජීවිතය ගැන ඉංග්‍රීසියෙන් ලියවුණු නවකතාව කුමක්ද ?
    (ආ)එම සුවිශේෂී නවකතාවේ රචකයා කවුරුන් ද?
02. (අ) එම රචකයා උපත ලැබුවේ කිනම් රටක කිනම් නගරයක ද?
    (ආ)ඔහු උපන් වර්ෂය මාසය හා දිනය සඳහන් කරන්න ?
03. (අ) ලෙනාඩ් වුල්ෆ්ගේ පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණ ද?
    (ආ)ඔහු එම පවුලේ කීවෙනි දරුවා ද?
04. (අ) ලෙනාඩ් වුල්ෆ් සිය මූලික අධ්‍යාපනය ලද පාසල් මොනවා ද?
    (ආ)ඔහු උපාධිය ලබාගත් වර්ෂය සඳහන් කරන්න.
05. (අ) ලෙනාඩ් වුල්ෆ් මුලින් ම ලංකාවට පැමිණියේ කිනම් වර්ෂයකදී ද?
    (ආ)සිවිල් නිලධාරියකු ලෙස ඔහු මුලින් ම සේවය ආරම්භ කළේ කොහේදී ද?
06. (අ) ඔහු දකුණු පළාතේ සේවයට පැමිණෙන්නේ කිනම් වර්ෂයකදී ද?
    (ආ)ඔහු එහි රාජකාරී භාරගන්නේ කවුරුන් හැටියට ද?
07. (අ) එසේ වැඩ භාරගනිද්දී වුල්ෆ් මහතාගේ පාලන දිස්ත්‍රික්කය වූයේ කුමක් ද?
    (ආ)ඔහු විවාහ වූයේ කවුරුන් සමඟින් ද?
08. (අ) ඔහු ''Village in the jungle'' කෘතිය පළකළේ කිනම් වර්ෂයකදී ද?
    (ආ)ඔහු මෙලොවින් සමුගත්තේ කිනම් දිනක ද?
09. (අ) ''Village in the jungle'' කෘතිය සිංහලට පරිවර්තනය කළේ කවුරුන් ද?
    (ආ)ඔහුගේ නමෙහි මුළකුරුවලින් කියවෙන නම් ලියන්න.
10. (අ) එම පරිවර්තකයාගේ වෙනත් පරිවර්තන කෘති දෙකක් නම් කරන්න.
    (ආ)''The Monkey'' කෘතිය ඔහු අතින් සිංහලයට පරිවර්තනය වූයේ කිනම් නමකින් ද?මෙබඳු

ප්‍රශ්නාවලියක් ඔබට නියමිත කොටස කියවා ඔබ විසින් ම සකස් කර ඒවාට පිළිතුරු සපයන්න. විභාගයේදී ලැබෙන කෙටි ප්‍රශ්නවලට සමාන ප්‍රශ්න ඒ ඇසුරෙන් සාදා ගැනීමට හැකි වනු ඇත.

* * *

සැකසුම
ජගත් කුමාර ජයසිංහ
ගුරු උපදේශක
දෙහිඕවිට අධ්‍යාපන කලාපය